**හැඳුනුම්පත් නිකුත්කිරීම**

**<u>හැඳුනුම්පතක් මුල් වරට ලබා ගැනීම</u>**

හැඳුනුම්පතක් මුල් වරට ලබා ගැනීමේ දී ඉදිරිපත් කළ යුතු ලියවිලි (වයස අවු 15 සම්පූර්ණ වූ විට)

- උප්පැන්න සහතිකයේ මුල් පිටපත
- ඡායාරූප 4 (ප්‍රමාණය - mm 45 X mm35)
- හැඳුනුම්පතක් සාදා නොමැති බවට පාසලේ විදුහල්පති විසින් නිකුත් කරන ලිපිය

* ඉහත ලියවිලි සමඟ ඔබ පදිංචි වසමේ ග්‍රාම නිලධාරි මහතා හමුවන්න

**<u>හැඳුනුම්පතක් මුල් වරට ලබා ගැනීම - (වයස අවු 17ට වැඩි නම්)</u>**

උචිත කාලය තුළ (වයස අවු 17ට වැඩි නම්) හැඳුනුම්පතකට අයදුම් නොකළ විට මුල් වරට අයදුම් කිරීමේ දී ඉදිරිපත් කළ යුතු ලියවිලි

- උප්පැන්න සහතිකයේ මුල් පිටපත / හිස් ප්‍රතිඵල සටහන
- දඩ මුදල් ගෙවීමේ ප්‍රකාශ පත්‍රය
- ඡායාරූප 4 (ප්‍රමාණය - mm 45 X mm35)
- වෙනත් සාක්ෂි සහිත ලියවිලි ( උප්පැන්න සහතික හෝ හිස් ප්‍රතිඵල සටහන් නැති විට)

* ඉහත ලියවිලි සමඟ ඔබ පදිංචි වසමේ ග්‍රාම නිලධාරි මහතා හමුවන්න

**<u>හැඳුනුම්පතක් සංශෝධනය කිරීම</u>**

හැඳුනුම්පතක් සංශෝධනය කිරීමේ දී ඉදිරිපත් කළ යුතු ලියවිලි

- උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත
- කලින් භාවිතා කළ හැඳුනුම්පත
- ඡායාරූප 4 (ප්‍රමාණය - mm 45 X mm35)
- සේවය / රැකියාව හැඳුනුම්පතට ඇතුළත් කළ යුතු නම් සේවා සහතිකයක් (මාස 6ට නොවැඩි)

* ඉහත ලියවිලි සමඟ ඔබ පදිංචි වසමේ ග්‍රාම නිලධාරි මහතා හමුවන්න

**<u>හැඳුනුම්පත අස්ථාන ගත වූ විට</u>**

හැඳුනුම්පතක් අස්තාන ගත වූ විට හැඳුනුම්පතක් සඳහා අයදුම් කිරීමේ දී ඉදිරිපත් කළ යුතු ලියවිලි

- උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත
- ඡායාරූප 4 (ප්‍රමාණය - mm 45 X mm35)
- පොලිස් වාර්තාව (මාස 6ට නොවැඩි)
- කලින් හැඳුනුම්පතක් භාවිතා කළ බවට සාක්ෂි ( තිබුනු හැඳුනුම්පතේ ඡායා පිටපතක්, බැංකු පොත් හෝ වෙනත් ලියවිලි)

* ඉහත ලියවිලි සමඟ ඔබ පදිංචි වසමේ ග්‍රාම නිලධාරි මහතා හමුවන්න

**<u>එක් දින සේවාවෙන් හැඳුනුම්පත් ලබා ගැනීමට නම් පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුයි</u>**

- පෙර අවස්ථා 3ට අදාල ලියවිලි සහ උප්පැන්න සහතිකයේ මුල් පිටපත
- අයදුම්කරු හැර වෙනත් අයෙකු හැඳුනුම්පත ලබා ගැනීමට ඉදිරිපත් වන්නේ නම් බලය පැවරීමේ ලියවිල්ල (මෙහිදී ඥාතිත්වය තහවුරු කළ හැකි අයෙකු ඉදිරිපත් විය යුතුයි (මව,පියා,බිරිඳ,සැමියා)

* ඉහත ලියවිලි සමඟ ඔබ පදිංචි වසමේ ග්‍රාම නිලධාරි මහතා හමුවන්න
* එක් දින සේවාවක් සඳහා රු 1000 ක මුදලක් පු.ලි. දෙපාර්තුමේන්තුව විසින් අය කෙරේ.